www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 4 වන කොටස

**The Historical and International Foundations of the Socialist Equality Party—Part 4**

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

## දෙවන ලෝක සංග්‍රාමයේ පැනනැගීම හා ට්‍රොට්ස්කිගේ අවසන් අරගලය

72. 1939 අගෝස්තුවේ ස්ටැලින්-හිට්ලර් ගිවිසුම අත්සන් තැබීම හා පසුව දෙවන ලෝක යුද්ධයේ පැන නැගීම, එක්සත් ජනපදයෙහි සමාජවාදී කම්කරු පක්ෂය ඇතුලත දේශපාලන අර්බුදයකට මඟ පෑදීය.[47] මැක්ස් ෂැට්මන්, ජේම්ස් බර්න්හැම් හා මාර්ටින් ඇබර්න් මූලිකත්වය ගත් දේශපාලන කන්ඩායමක් තර්ක කලේ, සෝවියට් සංගමය තව දුරටත් කම්කරු රාජ්‍යයක් ලෙස ගුනාංගීකරනය කල නොහැකි බවට ය. දැන් "නිලධාරීවාදී සාමූහික කරනය" ලෙස අංග ලක්ෂනය කල සෝවියට් රාජ්‍යයේ පන්ති ස්වභාවය පිලිබඳ බර්න්හැම්ගේ නිර්වචනයේ වෙනස තුලින් ගලා ආවේ, යුද්ධයක තතු තුල සෝසසසං ආරක්ෂාව සඳහා කැඳවුම් කිරීම හතරවන ජාත්‍යන්තරය විසින් නොකල යුතු බව ප්‍රකාශ කිරීමකි.

73. "නිලධාරිවාදී සාමූහික කරන" තන්ත්‍රයක් ලෙස ස්ටැලින්වාදය අංගලක්ෂනය කිරීම තුල - සූරාකෑමට ගොදුරු වන සමාජයක් පිලිබඳව මාක්ස්වාදය විසින් මීට පෙර නොදුටු ආකාරයේ නව්‍ය හා පෙර නොවූ විරූ - දුර දිග යන දේශපාලන හා ඓතිහාසික ඇඟවුම් ගැබ්වී තිබෙන බව ට්‍රොට්ස්කි ඊට පිලිතුරු දෙමින් කියා සිටියේය. අවසාන විග්‍රහයේ දී පරදුවට තැබෙන ප්‍රශ්නය නම්, මාක්ස්වාදී ව්‍යාපෘතියේ ම ඓතිහාසික වලංගු භාවයයි. තරමක් පසුව ෂැට්මන් විසින් ද වැලඳ ගත්, බර්න්හැම්ගේ නිබන්ධය යටින් පැවති පූර්ව සංකල්පය නම්, විප්ලවකාරී සමාජ බලවේගයක් ලෙස කම්කරු පන්තිය සිය විභවය අහිමි කර ගෙන ඇති බවයි. නූතන සමාජයේ සංවර්ධනය මෙහෙය වෙන්නේ, ජාත්‍යන්තර කම්කරු පන්ති විප්ලවයක පදනම මත අත් කර ගන්නා සමාජවාදය, දිශාවට නො වේ. ඊට වෙනස් ලෙස මතුව එන්නේ, කලමනාකරන තන්ත්‍රයක් විසින් පාලනය කරන හා මෙහෙය වන "නිලධාරිවාදී සාමූහික කරන" සමාජ ආකෘතියකි. බර්න්හැම් නිවැරදි වූයේ නම් එහි අර්ථය, මාක්ස්වාදය නූතන ඓතිහාසික ක්‍රියාවලිය සදොස් ලෙස වටහාගත් බව හා කම්කරු පන්තියට විප්ලවවාදී ක්‍රියාකලාපයක් ආරූඪ කිරීම, පොට වරද්දා ගැනීමක් වූ බවයි. එහෙත් බර්න්හැම්ගේ සංශෝධනවාදී ඉදිරිදර්ශනය වනාහි, සෝවියට් සංගමය ගැන කෙසේ වෙතත්, නූතන ධනේශ්වර සමාජයේ ආර්ථික පදනම් හා සමාජ ගතිකය පිලිබඳ භෞතිකවාදී විශ්ලේෂනයකින් පවා තොර, අපේක්ෂා භංගත්වයේ ලතෝනියක ප්‍රකාශනයකට නො අඩු දෙයකි. 1920 හා 1930 ගනන් වල පරාජයන් ගෙන් බර්න්හැම් හා ෂැට්මන් නිගමනය කලේ, සමාජවාදී විප්ලවය නොකෙරෙන වෙදකමක් බවට ය. ට්‍රොට්ස්කි මෙම ධාරනාවාදී හා අශුභවාදී ආස්ථානය ප්‍රතික්ෂේප කලේය. හතරවන ජාත්‍යන්තරය විප්ලවවාදී මාක්ස්වාදී ඉදිරිදර්ශනය දරා සිටින අතර කම්කරු පන්තිය ලද පරාජයන්, එහි මහජන පක්ෂවල දේශපාලන පාවාදීමේ ප්‍රතිපලය බව ඔහු පෙන්වා දුන්නේ ය. ඉහත විශ්ලේෂනයට එරෙහිව ට්‍රොට්ස්කි මෙසේ ලිවීය.

> ව්‍යාජ - මාක්ස්වාදයේ බියපත් හා නොමඟ ගිය සියලු වර්ගයේ නියෝජිතයන්, නායකත්වයේ බංකොලොත්කම "පිලිබිඹු" කරන්නේ නිර්ධන පන්තිය සිය විප්ලවවාදී දූත මෙහෙවර සාක්ෂාත් කිරීමෙහි ලා දක්වන නොසමත්කමය යන සංකල්පය මත ක්‍රියා කලහ. අපගේ සියලු විරුද්ධවාදීන් මෙම ආකල්පය පැහැදිලිව උච්ඡාරනය නොකල නමුත්, ස්ටැලින්වාදීන් හා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් පසෙකින් තැබුවත්, අතිවාමවාදීන්, මාධ්‍යමිකයන්, අරාජකවාදීන් යන සියලු දෙන පරාජයන්ගේ වගකීම තමන්ගේ ම දෙවුර මතින් කම්කරු පන්තියේ කර මතට පාත් කලහ. නිර්ධනීන් සමාජවාදී පෙරලිය සාක්ෂාත් කර ගැනීමට සමත් වන්නේ

හරියට ම කවර කොන්දේසි යටතේ ද යන්න පිලිබඳව, ඔවුන් කිසිවෙකුත් ඉඟි කරන්නේ නැත.[48]

74. ක්‍රියාමාර්ගය මත සමාජවාදී කම්කරු පක්ෂයේ ගැටුම, සමකාලීන සමාජ ක්‍රියාවලීන් පිලිබඳ එකිනෙකට ගැටෙන විසංවාදී සංකල්ප දෙකක් පිලිබිඹු කරන බව ට්‍රොට්ස්කි කියා සිටියේය.

> පරාජයට හේතු වූ මූලයන් ඇත්තේ කම්කරු පන්තියේ ම සමාජ ස්වභාවය තුල යයි අප පිලිගන්නේ නම්, එවිට නූතන සමාජයේ තත්වය වැදගැම්මකට නැතැයි පිලිගැනීමට අපට සිදුවේ. ලේ වැකි ධනේශ්වර ව්‍යසනයෙන්, සිය විමුක්තිය අත් කර ගැනීමේ ඓන්ද්‍රීය, ගැඹුරු හා යටපත් නොකල හැකි පිපාසාවකින් පෙලෙන පීඩිත මහජනතාව හා, යල් පිනූ කම්කරු නායකත්වයේ සංස්ථිතික, දේශප්‍රේමී හා තරයේ ම ධනේශ්වර වූ ස්වභාවය අතර ඇති ප්‍රගාඪ විසංවාදය පිලිබඳව, සිය මනස පැහැදිලි කර ගෙන ඇති අයෙකුට, මේ ප්‍රශ්නය මුන ගැසෙන්නේ මුලුමනින්ම වෙනස් ආකාරයකට ය. අපි මෙම මඟ නොහැරිය හැකි සංකල්ප දෙකෙන් එකක් තෝරා ගත යුත්තෙමු.[49]

75. කම්කරු පන්තිය විප්ලවවාදී බලවේගයක් නොවේ යයි තර්ක ගොඩනඟමින් යන විවිධ හැඩයන්ගේ දේශපාලන හා න්‍යායික ප්‍රවනතාවන්, හතරවන ජාත්‍යන්තරයට නොයක් විට මුන ගැසී ඇත. ඒ, පැබ්ලෝවාදී රූපයෙන් හෝ කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියාකලාපය ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ගේ දේශපාලන අවස්ථාවාදයේ පෙනුම සකස්කරන පදනම ලෙස ඇති, මාර්කියුස්, ඇඩෝනෝ, හෝකයිමර් වැනි "ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ" න්‍යාය ධාරීන්ගේ බලපෑමට හසුවූ, නිතර අපේක්ෂා භංගයට පත්ව සිටින රැඩිකල් හා "නව වමේ" ප්‍රවනතාවන්ගේ රූපයෙනි. ෂැට්මන් හා බර්න්හැම් සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගේ පශ්චාත් පරිනාමය ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය සනාථ කලේය. 1940 අප්‍රේල් මාසයේ දී ෂැට්මන් හා බර්න්හැම්, එස්ඩබ්ලිව්පී යෙන් කැඩීගොස් "කම්කරු පක්ෂය" පිහිටුවා ගත්හ. මසක් ඇතුලත තමන්ම ගොඩනැගූ සංවිධානය හැර දැමූ බර්න්හැම්, තමා තව දුරටත් මාක්ස්වාදියෙකු හෝ සමාජවාදියෙකු ලෙස සලකා නොගන්නා බව ප්‍රකාශ කලේය. අන්ත දක්ෂිනාංශය කරා වේගවත් පරිනාමයක ආරම්භය මේ මගින් සලකුනු කලේය. සෝවියට් සංගමයට එරෙහි පූර්ව භංග න්‍යෂ්ටික යුද්ධයක් සඳහා උපදේශකයෙකු බවටත්, 1950 ගනන්වල හිස ඔසවමින් තිබූ නව-සංස්ථිතික ව්‍යාපාරයේ ප්‍රමුඛ න්‍යායවාදියෙක් බවටත් ඔහු පත් විය. ඔහු මිය යාමට වසර ගනනාවකට පෙර 1982 දී, ජනාධිපති රොනල්ඩ් රේගන් විසින් බර්න්හැම්, විමුක්තියේ පදක්කමෙන් පුදනු ලැබීය. ෂැට්මන්ගේ ව්‍යාපාරයේ දකුනු ගමන තරමක් හෙමින් සිදුවිය. එහෙත් මූලධර්මාත්මකව නම් අඩුවක් නොමැතිව ය. ඔහු ප්‍රති කොමියුනිස්ට්වාදී ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරයේත්, ඩිමොක්‍රටික් පක්ෂයේ අතිශය ප්‍රතිගාමී සීතල යුද්ධ අංශයේත්, දේශපාලන උපදේශකයෙක් බවට පත් විය. ඔහු මිය යාමට පෙර 1972 දී, එක්සත් ජනපදය විසින් වියට්නාමයට බෝම්බ හෙලීමේ දී, ෂැට්මන් එයට සහාය දුන්නේය.

## ට්‍රොට්ස්කි ද්‍රව්‍යවාදී අපෝහකය ආරක්ෂාකල හැටි

76. 1939-40 අරගලයේ දී අවධානයට ලක් විය යුතු තවත් දෙයක් ඇත. එනම් එහි න්‍යායික-දර්ශනවාදී ධාරිතාවේ විශේෂත්වයයි. නිව් යෝර්ක් සරසවියේ දර්ශනවාදය පිලිබඳ මහාචාර්ය වරයෙකු වූ බර්න්හැම්, තමා භෞතිකවාදී අපෝහකයේ විරුද්ධවාදියෙකු බව ප්‍රකාශ කලේය. දර්ශනවාදී විඥානවාදයේ, විශේෂයෙන්ම එහි නව කාන්ටියානු ආකෘතියේ දෘෂ්ටි ආස්ථානයෙහි සිට අපෝහක භෞතිකවාදයට විරුද්ධවූ බොහෝ දෙනෙකු මෙන්ම බර්න්හැම් ද, මාක්ස් හා එංගල්ස් විසින් ආරක්ෂා කල භෞතිකවාදය හුදෙක්, 19 වන සියවසේ යල් පැන ගිය විද්‍යාවේ නිමැවුමක් ලෙස ද, ඩාවින්ගේ පරිනාමවාදී න්‍යාය සඳහා උවමනාවට වැඩියෙන් ගෞරව ප්‍රනාම පුද කිරීමේ හේතුව මත ද, එය ප්‍රතික්ෂේප කලේය. අපෝහකය සම්බන්ධයෙන් බර්න්හැම්, හේගල් වනාහි "මානව චින්තනය පිලිබඳව සියවසකට පෙර මිය ගිය කැපී පෙනෙන පිස්සෙක්" බව කියමින් ඔහු පරිහාසයට ලක් කලේය.[50] බර්න්හැම්ට දුන් සිය පිලිතුර තුල ට්‍රොට්ස්කි, භෞතිකවාදී අපෝහකය හා මහාචාර්ය වරයාගේ න්‍යායික විධික්‍රමය යන දෙකම පිලිබඳ සංක්ෂිප්ත ගුනාංගීකරනයක් ඉදිරිපත් කලේය. බර්න්හැම්ගේ තත්කාර්යවාදී දේහ කායත්, ඔහුගේ දේශපාලන නිගමනත් අතර සම්බන්ධතාව ට්‍රොට්ස්කි පැහැදිලි කලේයඃ

> ග්‍රාම්‍ය චින්තනය ක්‍රියාත්මක වනුයේ ධනේශ්වර ක්‍රමය, ධනේශ්වර ක්‍රමයටත්, සදාචාර ධර්ම, සදාචාර ධර්මවලටත්, සමාන වන්නේ ය යනාදී වශයෙන් සිතා ගනිමින්, ධනේශ්වර ක්‍රමය, සාරධර්ම, නිදහස, කම්කරු රාජ්‍යය යනාදිය ස්ථිතික වියුක්තයන් සේ සලකා නිර්මිත සංකල්ප ඇසුරිනි. අපෝහකාත්මක චින්තනය, සියලු ම දේවල් හා ප්‍රපංච, ඒවායේ අඛන්ඩ වෙනස් වීම පිලිබඳ සන්තතියෙහි තබා විශ්ලේෂනය කරනුයේ ᵇ තව දුරටත් ᵇ නොවීමත්, කම්කරු රාජ්‍යයක් තව දුරටත් කම්කරු රාජ්‍යයක් නොවීමත්,

සිදුවනුයේ කවර තීරනාත්මක සීමාවෙන් ඔබ්බෙහිදී ද යන්න එම වෙනස්වීම්වල භෞතික කොන්දේසි තුල නිර්නය කරන අතර වාරයෙහි ය.

ග්‍රාම්‍ය චින්තනයෙහි මූලික දෝෂය රඳනුයේ, එය, සදාකාලික චලනයෙන් සමන්විත වන යථාර්ථයක් පිලිබඳව වන අචල මුද්‍රාවන්ගෙන් තෘප්තිමත් වීමට දක්වන කැමැත්තෙහි ය. අපෝහක චින්තනය වඩාත් සමීපස්ථ සලකා බැලීම්, නිවැරදි කිරීම්, සංයුක්ත කිරීම් මගින් සංකල්පවලට අන්තර්ගතයෙහි පොහොසත් කමක් හා නම්‍යතාවක් ලබා දෙයි. එම සංකල්ප, එක්තරා දුරකට ජීවමාන ප්‍රපංචවලට ලං කරවන, යුෂ සහිත බවක් යනුවෙන් වුවත් මම පවසමි. සාමාන්‍ය වශයෙන් ධනේශ්වර ක්‍රමය නො වේ; වර්ධනයෙහි දෙනලද අදියරක පවතින, දෙන ලද ධනේශ්වර ක්‍රමයකි. සාමාන්‍ය වශයෙන් කම්කරු රාජ්‍යයක් නො වේ; අධිරාජ්‍යවාදී වට කිරීමක් ඇති, පසුගාමී රටක් තුල වන, දෙන ලද කම්කරු රාජ්‍යයකි, යනාදී වශයෙනි.

අපෝහක චින්තනය හා ග්‍රාම්‍ය චින්තනය අතරෙහි වෙනස, චලන චිත්‍රයක් හා අචල පින්තූරයක් අතරෙහි වෙනසට සමාන වේ. චලන චිත්‍රය විසින් අචල පින්තූරය විධි-විරෝධී භාවයට පත් නොකෙරේ; එහෙත් එය, චලනයෙහි නීතිවලට අනුකූලව, එබඳු අචල පින්තූර මාලාවක් එකිනෙකට සම්බන්ධ කරයි. අපෝහකය විසින් සංවාක්‍ය තර්කනය ප්‍රතික්ෂේප නො කෙරේ; එහෙත් එය අපගේ අවබෝධය, සදාකාලික ව වෙනස් වන යථාර්ථය වෙත වඩාත් සමීප කරවන අයුරින්, සංවාක්‍ය තර්කනයන් එකිනෙකට සම්බන්ධ කිරීමට අපට උගන්වයි. හේගල්, තම තර්ක ශාස්ත්‍රයෙන් නීති මාලාවක් ප්‍රතිෂ්ඨාපනය කලේ යඃ සංඛ්‍යාව ගුනය බවට පරිවර්තනය වීම, පරස්පර-විරෝධයන් ඔස්සේ වර්ධනය වීම, අන්තර්ගතය හා රූපාකාරය අතර ගැටුම, අඛන්ඩතාව බාධිත වීම, ශක්‍යතාව අනිවාර්යතාව බවට පරිවර්තනය වීම යනාදී වශයෙනි. සරල සංවාක්‍ය තර්කනය, වඩාත් ප්‍රාථමික කර්තව්‍යයක් සඳහා වැදගත් වන පරිමානයට, මෙම නීති මාලාව ද න්‍යායික චින්තනය සඳහා වැදගත් වෙයි.

හේගල් ලියුවේ ඩාවින්ට හා මාක්ස්ට පෙර ය. ප්‍රන්ස විප්ලවය විසින් චින්තනයට දෙන ලද බලගතු තල්ලුවට ස්තුති වන්නට හේගල් විද්‍යාවේ සාමාන්‍ය ප්‍රගමනය පෙර දුටුවේ ය. සුධීමතෙකුගේ වුවත් එය පෙරදැකීමක් පමනක් වූ හෙයින්, එයට, හේගල් අතින් ලැබුනේ විඥානවාදී ස්වරූපයකි. හේගල් ක්‍රියාත්මක වූයේ, තමන් විසින් පරම යථාර්ථය ලෙස ගනු ලැබුනු දෘෂ්ටිමය සෙවනැලි සමග ය. මෙම දෘෂ්ටිමය සෙවනැලි, ද්‍රව්‍යමය ශරීරවල චලනය විනා අනෙකක් පිලිබිඹු නොකල බව මාක්ස් පෙන්වා දුන්නේ ය.

අප අපගේ අපෝහකය, භෞතිකවාදී යයි හඳුන්වනුයේ, එහි මුල්, දිව්‍යලෝකයෙහි වත් අපගේ නිදහස් කැමැත්තෙහි පතුලේ වත් නො ව, වෛෂයික යථාර්ථයෙහි - ස්වභාවධර්මයෙහි පවතින හෙයිනි. සවිඥාන භාවය වැඩී ආවේ අවිඥාන භාවයෙනි; මනෝ විද්‍යාව, කාය විද්‍යාවෙනි, ඓන්ද්‍රිය ලෝකය අනින්ද්‍රිය ලෝකයෙනි, සෞර ග්‍රහ මන්ඩලය නෙබියුලාවෙනි. වර්ධනයේ මෙම ඉනිමගෙහි සියලුම හිනිපෙත්වල දී සංඛ්‍යාත්මක වෙනස්කම් ගුනාත්මක වෙනස්කම් බවට පරිවර්තනය කෙරුනි. අපෝහක චින්තනය ඇතුලු ව, අපගේ චින්තනය, වෙනස් වන ද්‍රව්‍යය අත් පත් කර ගන්නා ප්‍රකාශනයන් අතරින් එකක් පමනක් වෙයි. මෙම පද්ධතිය තුල දෙවියන්වහන්සේට වත් යක්ෂයාට වත් අමරනීය ආත්මයට වත් නීති හා සදාචාර ධර්ම පිලිබඳ සනාතන ඉගැන්වීම්වලට වත් තැනක් නැත. චින්තනයේ අපෝහකය, ස්වභාවධර්මයේ අපෝහකයෙන් වර්ධනය වී ඒමේ ප්‍රතිඵලය වශයෙන් මුලුමනින් ම භෞතිකවාදී වූ ස්වරූපයක් උසුලයි.[51]

77. "අපෝහක භෞතිකවාදයේ වඩාත් වියුක්ත ඉගැන්වීම් පිලිබඳ එකඟතාව හෝ නො එකඟතාව, අද දිනයේ හා හෙට දිනයේ වඩාත් සංයුක්ත දේශපාලන ප්‍රශ්න කෙරෙහි බලපාන්නේ යැයි යන්න - සැබවින් ම දේශපාලන පක්ෂ, ක්‍රියා මාර්ග හා අරගල පදනම් කෙරී ඇත්තේ එබඳු සංයුක්ත ප්‍රශ්න මතය - තවමත් කිසිවෙකු විසින් පැහැදිලි කෙරී ඇත්තේ ද නැත." යනුවෙන් ෂැට්මන් අවධාරනය කරයි. ට්‍රොට්ස්කි මෙසේ පිලිතුරු දුන්නේයඃ

> කවර පක්ෂ ද? කවර ක්‍රියා මාර්ග ද? කවර අරගල ද? සියලුම පක්ෂ හා සියලුම ක්‍රියා මාර්ග මෙහි දී එක ගොඩකට දැමේ. කම්කරු පන්තියේ පක්ෂය, අනෙක් සියලුම පක්ෂවලට වෙනස් වූවකි. එය, කිසිසේත්ම, " එබඳු සංයුක්ත ප්‍රශ්න මත" පදනම් කෙරී නැත. කම්කරු පන්තික පක්ෂය, එහි පදනමෙන් ම ගත් කල්හි, ධනේශ්වර අශ්ව වෙලඳුන්ගේ හා සුලු ධනේශ්වර වැරහැලි අන්ඩ දමන්නන්ගේ

පක්ෂවලට සෘජුව ම ප්‍රතිපක්ෂ ය. එහි කර්තව්‍යය වනුයේ, සමාජ විප්ලවයක් සූදානම් කිරීමත් නව භෞතික හා සදාචාරමය පදනම් මත මානව වර්ගයා පුනර්ජීවනය කිරීමත් ය. ධනේශ්වර මහජන මතයෙහිත් පොලිස් මර්දනයෙහිත් පීඩනයට යටත් නොවනු පිනිස, කම්කරු විප්ලවවාදීන්ට, වඩාත් ම එහි නායකයන්ට - විශද වූ ද දූරදර්ශී වූ ද පරිසමාප්ත වශයෙන් සිතාබලා සකස් කර ගනු ලැබුනා වූ ද ලෝක දෘෂ්ටියක් අවශ්‍ය වෙයි; " සංයුක්ත" ප්‍රශ්නවලට නිරවද්‍ය ලෙස ප්‍රවේශ විය හැකි වනුයේ ඒකීය මාක්ස්වාදී සංකල්පයක පදනම මත පිහිටීමෙන් පමනි.[52]

## සුලු ධනපති විරුද්ධත්වය හා පක්ෂ සංවිධානය

78. එස්ඩබ්ලිව්පී ය තුල කන්ඩායමික අරගලයේ මුල් අදියරකදී ම ට්‍රොට්ස්කි නිර්වචනය කලේ, ෂැට්මන්-බර්න්හැම්-ඇබර්න් සුලුතරය "සම්භාව්‍ය සුලු ධනපති ප්‍රවනතාවක්" ලෙසය. මෙය අහේතුක නිගරුවක් නොවේ. එසේ කරන ලද්දේ 1905 හා 1917 විප්ලවයන් දෙකකට නායකත්වය දීම ද, රතු හමුදාව නිර්මානය කරමින් හා එය මෙහෙයවීම ද ඇතුලුව හතලිස් වසරකට වැඩි කාලයක දේශපාලන අත්දැකීම් සම්භාරයක් කැටිකර ගත් අයෙකුගේ පදනමෙහි පිහිටා ය. "සමාජවාදී ව්‍යාපාරය තුල ඕනෑම සුලු-ධනපති කන්ඩායමක ගේ" ගති ලක්ෂන, ට්‍රොට්ස්කි සුලුතරයේ කොටස් තුල හඳුනා ගත්තේය. එයට මේ දේවල් ඇතුලත්ය. "න්‍යාය කෙරෙහි අවඥා සහගත ආකල්පයක් හා සාර සංග්‍රහවාදය දිශාවට නැඹුරුවක්; තමන්ගේ ම සංවිධානයේ සම්ප්‍රදාය කෙරෙහි නිගරු සහගත ආකල්පයක්; වෛෂයික සත්‍යය පිලිබඳ උද්යෝගී භාවයට අලාභ හානි පමුනුවමින් පුද්ගලික "නිදහස" පිලිබඳව උද්යෝගීමත් වීම, තිරසර ගතිය වෙනුවට ඉක්මනින් කලබල වන ගතිය; එක් ආස්ථානයකින් තවත් ආස්ථානයකට පනින්නට තිබෙන සූදානම; විප්ලවීය මධ්‍යගත භාවය පිලිබඳ අවබෝධයෙන් තොර වීම හා එය කෙරෙහි දක්වන ද්වේෂය; අවසාන වශයෙන්, පක්ෂ විනය වෙනුවට කල්ලි ගැසීම හා පුද්ගලික සම්බන්ධතා ආදේශ කිරීමට පවතින නැඹුරුව. [53]

79. කැනන්, පුද්ගලිකත්වයේ සියලු ප්‍රකාශනයන් පාගා දැමීමට කැපවී ගත් රුදුරු පක්ෂ නිලධරයේ ලොක්කා ලෙස හඳුන්වමින්, තොර තෝංචියක් නැතිව එස්ඩබ්ලිව්පීයේ සංවිධානාත්මක භාවිතය හෙලා දුටු සුලුතරය, හිස ඔසවන ස්ටැලින් කෙනෙකු ලෙස ඔහු හංවඩු නොගැසුවා පමනි. වචනවලින් තිගැස්මට පත් නොවූ කැනන් මෙසේ සඳහන් කලේය.

සුලු ධනපති බුද්ධි ජීවීන් ස්වභාව ධර්මය විසින් ම යලි පරීක්ෂනයට බඳුන් කෙරෙයි. සිය ආවේගයන්, දෙගිඩියාව, බිය හා මහ ජනතාවගේ හැසිරීම් හා මනෝගතීන් කෙරෙහි ද, සිය පුද්ගලික ඉරනම පිලිබඳ ආත්මාර්ථකාමී උත්සුකයන් කෙරෙහි ද යන සියල්ලේ දී ඔවුහු පොට වරද්දා ගනිති. ඔවුහු තමන්ගේ ම වැදගැම්මකට නැති රිදුම් හා වේදනාවන් මගින් ලෝකයේ වේදනාව මැන බලති. [54]

80. පක්ෂයේ සංවිධානාත්මක භාවිතයන් හෙලා දැකීමේදී සුලු-ධනපති සුලුතරය ඊට සමාන රටාවක් අනුගමනය කල බව කැනන් පෙන්වා දුන්නේය.

...පලමුවන ජාත්‍යන්තරය අවධියේ පටන්ම විප්ලවකාරී කම්කරු ව්‍යාපාරයේ ඉතිහාසය වනාහි, මාක්ස්වාදීන්ගේ " සංවිධානාත්මක විධි ක්‍රමයන්" ට එරෙහිව විසකුරු ප්‍රහාරයන් මඟින් තමන්ගේ ම න්‍යායික හා දේශපාලන දුබලකම පියවා ගැනීමට, සියලු වර්ගයේ සුලු-ධනපති කන්ඩායම් හා ප්‍රවනතාවන් දැරූ උත්සාහයන් පිලිබඳ අතොරක් නැති පුරාවෘත්තයකි. සංවිධානාත්මක විධික්‍රම පිලිබඳ ශීර්ෂ පාඨය යටතේ විප්ලවවාදී මධ්‍යගතවාදී සංකල්පයේ පටන් පරිපාලනයේ එදිනෙදා කරුනු දක්වා වූ සියල්ල ඔවුහු මීට ඇතුලත් කලහ. ඉන් එහාට යන විට සිය ප්‍රධාන විරුද්ධවාදීන්ගේ පුද්ගලික චර්යාව හා විධික්‍රම "නරක, කයෝර, කුරිරු" හා සැබවින්ම, සැබවින්ම, සැබවින්ම, "නිලධාරීවාදී" යයි ඔවුහු අවිචල්‍ය ලෙස විස්තර කල සියල්ල ද ඊට ඇතුලත් කලහ. අද වන විට අරාජකවාදීන්ගේ ඕනෑම කුඩා කන්ඩායමක් "ඒකාධිපති" මාක්ස් බකුනින්ට නො සැලකුවේ කෙසේද යන්න ඔබට පැහැදිලි කර දෙනවා ඇත.

එක්සත් ජනපදය තුල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ එකොලොස් වසරක ඉතිහාසය තුල එවන් අත්දැකීම් ඉතා සුලභය. හැම විටම, අභ්‍යන්තර අරගල හා කන්ඩායමික ගැටුම්, මූලධර්මාත්මක ප්‍රශ්න සංවිධානාත්මක කල කෝලාහල මඟින් පිටු දැකීමට දැරූ උත්සාහයන්ට එරෙහි අරගලයක් විය. අපගේ ව්‍යාපාරයේ ප්‍රධාන කේඩරයන් ඉගෙන ගෙන තහවුරු වූ එක් කොටසක් වූයේ මෙම අරගලයයි. දේශපාලනිකව දුබල විරුද්ධවාදීන් සෑම කල්හිම මෙම ප්‍රයෝගය උපයෝගී කර ගැනීමට බැලූහ.[55]

81. "සංවිධානාත්මක ප්‍රශ්නය" පිලිබඳ කැනන්ගේ විශ්ලේෂණයත්, එස්ඩබ්ලිව්පීය "නිර්ධන පන්තික" දිශානතියක පිහිටුවීම සඳහා ඔහු කල අරගලයත් ට්‍රොට්ස්කි උනුසුම් ලෙස පිලිගත්තේ ය. ඔහු මෙසේ ලිවීය: 'ජිම්ගේ පත්‍රිකාව විශිෂ්ඨය. එය අව්‍යාජ කම්කරු නායකයෙකුගේ රචනයකි. සාකච්ඡාව මෙම ලිපියට වැඩියෙන් යමක් ඉදිරිපත් නොකලේ නම් එය පිලිගත හැකිය." [56]

## දෙවන ලෝක යුද්ධයේ පැන නැගීම හා හතරවන ජාත්‍යන්තරය

82. නාසි ජර්මනිය පෝලන්තය ආක්‍රමනය කිරීමත් සමඟ, 1939 සැප්තැම්බරයේ දී දෙවන ලෝක යුද්ධය පුපුරා ගියේය. ඊට යන්තම් සතියකට පෙර ස්ටැලින්වාදී තන්ත්‍රය සමඟ අත්සන් තැබූ "අනාක්‍රමනික ගිවිසුම" මගින් හිට්ලර්ගේ ලේ වැකි ප්‍රහාරය සඳහා අවස්ථාව සැලසුනි. 1939 ශරත් සමයේ භීෂනය දියත් කිරීම සඳහා ක්ෂනික දේශපාලන හා මිලිටරි අවේශය ගෙන දුන්නේ තුන්වන රීචයේ මූලෝපායික අරමුනු වලිනි. කෙසේ වෙතත් වඩා ප්‍රාථමික මට්ටමක දී යුද්ධය ඇවිල ගියේ ප්‍රථම ලෝක සංග්‍රාමය මගින් ජනනය කල ආර්ථික හා භූ දේශපාලනික ප්‍රතිසතිතාවන්ගේ හා ඉන් එහාට, ජාතික රාජ්‍ය පද්ධතියේ ඓතිහාසික දිරාපත් වීම හා ලෝක ධනවාදයේ පොදු ආර්ථික බිඳ වැටීමේ තතු තුලය. යුද්ධය ප්‍රජාතන්ත්‍රවාදය හා ෆැසිස්ට්වාදය අතර ගැටුමක් ලෙස මවා පෑමට දැරූ උත්සාහයන් ට්‍රොට්ස්කි බැහැර කලේය. ඔහු මෙසේ ලිවීය. "වර්සෙලීස් ගිවිසුම අත්සන් තැබීමට පෙර ම එහි හවුල් කරුවෝ ආරම්භ කල වර්තමාන යුද්ධය වැඩී ආවේ, අධිරාජ්‍යවාදී ප්‍රතිවිරෝධතා තුලිනි. එකිනෙකට මුහුන ලා එකම මාර්ගයේ දිව වූ දුම්රිය දෙකක් එකිනෙක ගැටෙනු නො වැලැක්විය හැකිවා සේම යුද්ධය ද නො වැලැක්විය හැකි දෙයකි." [57] 1940 මැයි මාසයේ දී අධිරාජ්‍යවාදී යුද්ධය පිලිබඳව හතරවන ජාත්‍යන්තරයේ ප්‍රකාශනය තුල ලිවූ ට්‍රොට්ස්කි, ගෝලීය ව්‍යසනයේ වගකීම තැබුවේ සියලු ප්‍රධාන රටවල අධිරාජ්‍යවාදී ධනේශ්වරය මතය. ප්‍රන්සය, බ්‍රිතාන්‍යය, හා එක්සත් ජනපදය විසින් හිට්ලර්ගේ ඒකාධිපති තන්ත්‍රය පිලිබඳව කල් ප්‍රමාදවී කල හෙලාදැකීම නරුමත්වයේ කුනු ගඳින් පිරී ඇත. ට්‍රොට්ස්කි මෙසේ ලිවීය:

> ඒ දිනවල බොල්ශෙවික්වාදයට එරෙහිව කුරුස යුදධයේ නියැලි අයෙක් ලෙස හිට්ලර් හුවා දැක්වූ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු, දැන් ඔහු හඳුන්වන්නේ, ශුද්ධ වූ ගිවිසුම්, දේශ සීමා, නීති හා රෙගුලාසි උලංඝනය කරන අනපේක්ෂිත ලෙස නිරයේ පතුලෙන් නැගී ආ යම් වර්ගයක යක්ෂයෙකු ලෙසය. හිට්ලර් නොවුනා නම් ධනවාදී ලෝකය උද්‍යානයක් සේ මලින් පිරී යාමට තිබුනා සේය. කෙතරම් නම් ප්‍රබෝධමත් පවයක් ද සිය හිස් කබලේ එකතුකිරීමේ යන්ත්‍රයක් ද, දැනෙහි අසීමිත බලයක් ද සහිත ජර්මනිය නමැති මේ අපස්මාර රෝගියා අහසින් කඩා වැටුනේ හෝ නිරයෙන් නැගී ආවේ නොවේ. ඔහු අනෙකෙක් නොව අධිරාජ්‍යවාදයේ සියලු විනාශකාරී බලයන්ගේ පුද්ගලාරෝපනයයි. පැරනි යටත් විජිත බලයන් එහි දෙපතුල දක්වා ම සොලවා ලූ හිට්ලර්, ගෙන දුන්නේ වෙන කිසිවක් නොව, අධිරාජ්‍යවාදයට බලය සඳහා වඩාත් පරිපූර්න වූ අධිෂ්ඨානයේ ප්‍රකාශනයකි. හිට්ලර් හරහා තමන්ගේ ම වංකගිරියේ අලා මූලාවට පත්වූ ලෝක ධනවාදය, තියුනු මුවහත ඇති කිනිස්ස තමන්ගේ ම බඩවැල් තුලට බස්සමින් සිටිති.
>
> දෙවන අධිරාජ්‍යවාදී යුද්ධයේ අලුගෝසුවන්, තමන්ගේ ම පව් සෝදා ගැනීමට හිට්ලර් දුක් ගන්නා රාල කෙනෙක් බවට පත් කර ගැනීමට අසමත් වනු ඇත.
>
> නිර්ධන පන්තියේ විනිශ්චය මන්ඩපය හමුවේ වර්තමානයේ සියලු පාලකයන්ට උත්තර බැඳීමට සිදුවනු ඇත. විත්ති කූඩුවේ සිටින අපරාධ කරුවන් අතර පලමු තැන ගැනීමට වැඩි දෙයක් හිට්ලර් නොකරනු ඇත. [58]

83. ප්‍රකාශනය එක්සත් ජනපදයේ ක්‍රියාකලාපය කෙරෙහි අවධානය යොමු කලේය. 1940 වන විට එය සිටියේ ගැටුමේ හෙලි තුඩට පිටතිනි. යුද්ධය මගින් ගෙන දුන් අවස්ථාව, ලෝක ධනවාදයේ කටයුතු පිලිබඳව එක්සත් ජනපදයේ අධිපතිවාදී තත්වය සුරක්ෂිත කර ගැනීමට ඇමරිකානු ධනේශ්වරය විසින් ඩැහැ ගනු ඇතැයි ට්‍රොට්ස්කි අනාවැකි පල කලේය. මෙය හුදෙක් අභිලාශයන් පිලිබඳ කාරනයක් නොව, ආර්ථික හා දේශපාලන අවශ්‍යතාවයකි:

> ලෝකයේ ප්‍රමුඛ තම ධනේශ්වර බලවතා ලෙස එක්සත් ජනපද සතු කාර්මික, මූල්‍ය හා මිලිටරි ශක්තිය ඇමරිකානු ආර්ථික දිවියේ මල්පල ගැන්වීමක් කිසිසේත්ම සහතික නොකරන අතර ඒ වෙනුවට, අර්බුදයට පත් ඇගේ සමාජ පද්ධතියේ විශේෂයෙන් දුස්සාධ්‍ය හා කැලඹිලිකාරී ස්වභාවය මල්පල ගන්වනු ඇත. බිලියන ගනන් රත්තරන් ද, මිලියන ගනන් රැකියා වියුක්තිකයන් ද ප්‍රයෝජනවත් නොවනු ඇත. සය වසරකට පෙර ප්‍රකාශයට පත් කල *යුද්ධය හා හතරවන ජාත්‍යන්තරය* නම් හතරවන ජාත්‍යන්තරයේ නිබන්ධය තුල එය මෙසේ අනාවැකි පල කලේය.

"1914 දී ජර්මනිය යුද්ධයේ මාවතට තල්ලුකර හැරි එම ගැටලුවලට ම එරෙහිව දැන් එක්සත් ජනපදය ද මුහුන දී සිටියි. ලෝකය බෙදා ඇත් ද? එය යලිත් බෙදිය යුතුය. ජර්මනිය සම්බන්ධයෙන් තිබුනේ 'යුරෝපය සංවිධානය කිරීමේ' ප්‍රශ්නයයි. එක්සත් ජනපදය මුලු ලෝකයම 'සංවිධානය' කල යුතුය. ඉතිහාසය මානව වර්ගයා ඇමරිකානු අධිරාජ්‍යවාදය නමැති ගිනිකන්ද පුපුරා යාම සමඟ මුහුනට මුහුන ලා පිහිටුවයි." [59]

84. ප්‍රකාශනය ඇමරිකානු අධිරාජ්‍යවාදය මෙහෙය වෙන ප්‍රධාන ගාමක බලවේග විශ්ලේෂනය කලේය.

එක් හෝ තවත් නිමිත්තක් හා සටන් පාඨයක් යටතේ, එක්සත් ජනපදය සිය ලෝක ආධිපත්‍ය පවත්වා ගැනීම සඳහා දැවැන්ත ගැටුම්වලට මෙහෙය වෙනු ඇත. ඇමරිකානු ධනවාදය හා එහි සතුරන් අතර ගැටුම් හටගන්නා පිලිවෙල හා වේලාව සමහර විට වොෂින්ටනය පවා තවමත් නො දැන සිටිනු ඇත. ජපානය සමඟ යුද්ධය පැසිෆික් සාගරයෙහි "ජීවත් වීමේ ඉඩ කඩ" සඳහා අරගලයක් වනු ඇත. අත්ලාන්තික් සයුරේදී, ක්ෂනිකව ජර්මනියට එරෙහිව යොමු වුවත් එය, මහාබ්‍රිතාන්‍යයේ උරුමය සඳහා අරගලයක් වනු ඇත.

මිත්‍ර පාර්ශවය මත ජර්මනියේ ජයග්‍රහනයක ශක්‍යතාව වොෂින්ටනයට උඩින් එල්බී තිබෙන බියකරු සිහිනයක් වැනිය. යුරෝපානු මහාද්වීපය හා එහි පදනම වශයෙන් ඇති ඇගේ යටත් විජිත සතු සම්පත් සමඟ, යුරෝපයේ සියලු අවි ආයුධ කම්හල් හා ඇයට ප්‍රයෝජනයට ගත හැකි නැව් තටාකාංගන විශේෂයෙන්ම ඒ පාර්ශවයෙන් ජපානය සමඟ ඒකාබද්ධ වූ ජර්මනිය, ඇමරිකානු අධිරාජ්‍යවාදයට මාරක අන්තරායන් ගැබ්කර ගනියි. මේ අර්ථයෙන් ගත් කල යුරෝපා භූමියේ දැන් කෙරී ගෙන යන දැවැන්ත සටන්, ජර්මනිය හා ඇමරිකාව අතර ගැටුමට සූදානම් වීමේ පෙර හුරුවක් පමනක් වනු ඇත. [60]

85. හතරවන ජාත්‍යන්තරයේ ප්‍රකාශනය, යුද්ධයට විරුද්ධවන ලෙස එක්සත් ජනපදයේ කම්කරුවන්ට කැඳවුම් කල නමුත්, සුලු ධනේශ්වරයේ සාමවාදය විශේෂයෙන් හෙලා දුටුවේය.

එක්සත් ජනපදය යුද්ධයට අවතීර්න වීමට එරෙහි අපගේ අරගලයට, හුදෙකලාවාදය හා සාමවාදය සමඟ කිසිදු සාම්‍යයක් ඇත්තේ නැත. අධිරාජ්‍යවාදී ආන්ඩුව මෙරට යුද්ධයට ඇද දැමීමේ දී කිසිදු අයුරකින් පසුබට නොවනු ඇතැයි අපි කම්කරුවන්ට කියා සිටින්නෙමු. පාලක පන්තිය ඇතුලත පවතින මතභේදය, යුද්ධයට පිවිසෙන්නේ කවදා ද හා පලමු වෙඩි මුරය නිකුත් කරන්නේ කාට එරෙහිව ද යන්න පිලිබඳව පමනි. පුවත් පත්වල ලිපි පලකිරීමෙන් හා සාමවාදී යෝජනා සම්මත කිරීමෙන්, එක්සත් ජනපදය මධ්‍යස්ථව තබා ගැනීමට කරන ගනන් බැලීම වනාහි, මහෝඝයක් කොස්සක් හරස් කර නතර කිරීමට දරන උත්සාහයකට සමාන ය. යුද්ධයට එරෙහි සැබෑ අරගලය වනාහි අධිරාජ්‍යවාදයට එරෙහි පන්ති අරගලයත්, සුලු-ධනපති සාමවාදය නිර්ධය ලෙස හෙලිදරව් කිරීමත් ය. ඇමරිකානු ධනේශ්වරය දෙවන අධිරාජ්‍යවාදී යුද්ධයට පැනීමත්, තුන්වන ලෝක යුද්ධය ඇරඹීමත් නතර කල හැක්කේ විප්ලවයෙන් පමනි. අන් සියලු ක්‍රමවේදයන් බොරු පන්ඩිත මානයේ හෝ අමන කමේ හෝ ඒ දෙකේම සංකලනයකි. [61]

86. යුද්ධය කෙරෙහි අකර්මන්‍යව ප්‍රතිරෝධය පාන්නාවූ සුලු ධනපති සාමවාදීන්ට විරුද්ධව හතරවන ජාත්‍යන්තරය වෘත්තීය සමිතිවල පාලනය යටතේ කම්කරු පන්තික නිලධාරීන් විසින් කම්කරුවන් යුද ශිල්පයෙන් පුහුනු කිරීම සඳහා කැඳවුම් කලේය. එක්සත් ජනපදය තුලත් එහි මිත්‍ර පාක්ෂිකයන් අතරත් පාලක පන්තිය, නාසි පාලන තන්ත්‍රය කෙරෙහි කම්කරු පන්තියේ පුලුල් කොටස් තුල පැවති වෛරය ගසා කමින්, "ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යුද්ධය" යන කඩතුරාව යටතේ යුද්ධය විකුනා කෑමට උත්සාහ කලේය. 1941 දී ජර්මානුන් විසින් සෝවියට් සංගමය ආක්‍රමනය කිරීමෙන් පසුව, අධිරාජ්‍යවාදී මිත්‍රත්ව බලවතුන් සමඟ සිය යුද කාලීන සන්ධානයේ කොටසක් ලෙස, ස්ටැලින්වාදීන් විසින් මෙම සටන් පාඨය ඩැහැ ගත්හ. හතරවන ජාත්‍යන්තරය එය එක පැහැර ප්‍රතික්ෂේප කලේය.

ෆැසිස්ට්වාදයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යුද්ධයක් යන සටන් පාඨය බොරුවකට නො අඩු දෙයකි. හිට්ලර් හා ඔහුගේ හෙන්චයියන් කන්ඩායම බලයට පත්වීමේ දී බ්‍රිතාන්‍ය ආන්ඩුවෙන් ලැබුනු සහාය ගැන කම්කරුවන්ට අමතක වී ඇති බව සිතන්නා සේ ය. යථාර්තයේ දී අධිරාජ්‍යවාදී ප්‍රජාතන්ත්‍රවාදයන් වනාහි ඉතිහාසයේ ප්‍රමුඛතම ප්‍රභූ තන්ත්‍රයන් ය. ප්‍රන්සය, එංගලන්තය, බෙල්ජියම, ඕලන්දය යටත් විජිත ජනතාව වහල් භාවයට ගැනීම මත පදනම් වූහ. එක්සත් ජනපද ප්‍රජාතන්ත්‍රවාදය සමස්ත මහාද්වීපයේම

දැවැන්ත ධන සම්පත් අල්ලා ගැනීම මත පදනම් විය. මේ සියලු "ප්‍රජාතන්ත්‍රවාදයන්" ගේ උත්සාහයන් යොමුව තිබුනේ සිය වරප්‍රසාදිත තත්වය රැකගැනීම දෙසට ය. අධිරාජ්‍යවාදී ප්‍රජාතන්ත්‍රවාදයන් විසින් යුද්ධයේ බරෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පටවන ලද්දේ සිය කොලනි මතය. සිය වහල් හිමියන්ගේ පැවැත්ම සුරක්ෂිත කර දීම සඳහා ලේ හා රත්රන් සැපයීමට බල කෙරුනේ වහලුන්ට ය.[62]

87. ස්ටැලින්වාදී තන්ත්‍රය යුද කාලසීමාව ආරම්භයේ දී ම, ජර්මනිය සමඟ ඇති කර ගත් සන්ධානය මෙන්ම, තමන් යටතේ පැවති ෆින්ලන්තය හා පෝලන්තය තුල එහි රුදුරු පිලිවෙතින්, පිරිහුනු කම්කරු රාජ්‍යයක් ලෙස සෝවියට් සංගමයේ සමාජ ස්වභාවය වෙනස් නොකරන බව ට්‍රොට්ස්කි අවධාරනය කලේය. ස්ටැලිනවාදයේ අපරාධ හා ද්‍රෝහිත්වය තිබිය දී ම හතරවන ජාත්‍යන්තරය, අධිරාජ්‍යවාදයට එරෙහිව සෝසසසං ආරක්ෂාව සඳහා තවමත් පෙනී සිටියේය.

ඊයේ වන තෙක්ම ෆැසිස්ට්වාදයට එරෙහි "ප්‍රජාතන්ත්‍රවාදී" බලවේග බලමුලු ගැන්වීමේ අක්ෂයක් ලෙස සෝවියට් සංගමය කෙරෙහි විශ්වාසය තැබීමට සූදානම්ව සිටි සුලු ධනපති රැඩිකල්ලු, දැන් සිය පීතෘභූමීන්ට හිට්ලර් විසින් තර්ජනය කර තිබිය දී මොස්කෝව සිය සහායට නොපැමිනි කල, එය අධිරාජ්‍යවාදී පිලිවෙත ම ගෙන යන බවත් සෝසසසං හා ෆැසිස්ට් රාජ්‍යයන් අතර වෙනසක් නොමැති බවත් හදිසියේ ම සොයාගත්හ.

පන්ති විඥානයෙන් යුත් සෑම කම්කරුවෙක්ම මෙය "බොරුවක්!" බව කියා සිටිය යුතුය. එහි වෙනසක් තිබේ. මෙම රැඩිකල් හුලං බෝලවලට වඩා සමාජ වෙනස්කම් පිලිබඳව ගැඹුරු හා මනා අවබෝධයක් ධනේශ්වරයට තිබුනි. සහතිකෙන්ම, එක් රටක් තුල, පසුගාමී ද වන එරටෙහි, නිෂ්පාදන මාධ්‍යයන් ජනසතු කිරීම තවමත් සමාජවාදය ගොඩනැඟීම පිලිබඳ සහතිකයක් නොවීය. එහෙත් සමාජවාදය සඳහා මූලික පූර්වාවශ්‍යතාවක් වන නිෂ්පාදන බලවේගවල සැලසුම්ගත සංවර්ධනයක හැකියාව, තවමත් එරට සතුව ඇත. නිෂ්පාදන මාධ්‍යයන් ජනසතු කල පමනින්ම ජනතාවගේ ශුභ සිද්ධිය සැලසීමට එයට නොහැකිවීය යන පදනම මත යමෙක්, ඊට පිටුපස හරවන්නේ නම්, එය සමාන වන්නේ වහල හා බිත්ති නොමැතිව ජීවත්විය නොහැකිය යන පදනම මත කලුගල් අත්තිවාරම බිඳ දැමීමකටය.

88. කෙසේ වෙතත් අධිරාජ්‍යවාදයෙන් සෝවියට් සංගමය ආරක්ෂා කිරීම, ස්ටැලින්වාදී නිලධරයට කිසිදු දේශපාලන සහන පිදීමක් ඇඟවුම් නොකරයි.

හතරවන ජාත්‍යන්තරයට සෝවියට් සංගමය ආරක්ෂා කල හැක්කේ විප්ලවවාදී පන්ති අරගලයේ ක්‍රමවේදයන් මඟින් පමනි. අධිරාජ්‍යවාදී හා යටත් විජිත රටවල කම්කරුවන්ට, රාජ්‍යයේ පන්ති ස්වභාවය හා ඒවා අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව මෙන්ම ඒ හැම එකක් තුලම ඇති අභ්‍යන්තර පරස්පර විරෝධයන් නිවැරදිව අවබෝධ කර ගැනීමට ඉගැන්වීමෙන්, සෑම දී ඇති තත්වයක් තුලදී ම නිවැරදි ප්‍රායෝගික නිගමනවලට එලඹීමට ඔවුන්ට හැකියාව ලබාදෙයි. මොස්කව් කතිපයාධිපත්‍යයට එරෙහිව වෙහෙස නොබලා අරගලයක යෙදෙන අතර ම හතරවන ජාත්‍යන්තරය, සෝසසසං එරෙහිව අධිරාජ්‍යවාදයට අනුබල දෙන ඕනෑම ප්‍රතිපත්තියක් තරයේ ම ප්‍රතික්ෂේප කරයි.

ප්‍රතිපත්තියක් වශයෙන් සෝවියට් සංගමය ආරක්ෂා කිරීම ලෝක සමාජවාදී විප්ලවය සූදානම් කිරීම සමඟ සම්පාත වෙයි. මුග්ධ හා ප්‍රතිගාමී ස්ටැලින්වාදයේ නිමැවුම වන තනි රටේ සමාජවාදය පිලිබඳ න්‍යාය අපි එක හෙලා ප්‍රතික්ෂේප කරන්නෙමු. සෝවියට් සංගමයේ සමාජවාදය ආරක්ෂා කල හැක්කේ ලෝක විප්ලවයට පමනි. එහෙත් ලෝක විප්ලවය සමඟ මග නොහැරිය හැකි පරිදි, ක්‍රෙම්ලින් කතිපයාධිපත්‍ය මකා දැමීමේ කාර්යය ද රැගෙන එයි.[63]

89. ලෝක සමාජවාදී විප්ලවය පිලිබඳ හතරවන ජාත්‍යන්තරයේ මූලෝපාය දැඩි ලෙස යලි අවධාරනය කරමින් ප්‍රකාශනය සමාප්ත කරයි.

දෙවන හා තුන්වන ජාත්‍යන්තරයන් හා සසඳන විට හතරවන ජාත්‍යන්තරය එහි ප්‍රතිපත්තිය පිහිටුවන්නේ ධනේශ්වර රාජ්‍යයන්හි මිලිටරි ජයග්‍රහන මත නොව, අධිරාජ්‍යවාදී යුද්ධය ධනේශ්වරයට එරෙහි කම්කරුවන්ගේ යුද්ධයක් බවටත්, සියලු රටවල පාලක පන්තීන් පෙරලා දමන ලෝක සමාජවාදී විප්ලවය බවට ද පරිවර්තනය කිරීම මත ය. ජාතික ප්‍රාග්ධනය විනාශ කිරීම, භූමි භාගයන් අල්ලාගැනීම, තනි තනි රාජ්‍යයන්හි බිඳවැටීම යනාදි වශයෙන් සටන් පෙරමුනේ හැල හැප්පීම් මෙම දෘෂ්ටි

ආස්ථානයෙන් සිට ගත්කල නියෝජනය කරන්නේ නූතන සමාජය ගොඩනැගීමේ මාවතෙහි බේදනීය අවස්ථාවන් ලෙසය.

යුද්ධයේ මාවතෙන් ස්වාධීනව අපි මූලික වැඩ කොටසක් සපුරා ලන්නෙමු. ලේ පිපාසිත ධනවාදයේ උවමනා එපාකම් හා කම්කරුවන්ගේ අවශ්‍යතාවන් අතර විසංවාදය අපි ඔවුනට පැහැදිලි කරන්නෙමු. අපි අධිරාජ්‍යවාදයට එරෙහිව කම්කරුවන් බල මුලු ගන්වන්නෙමු. යුදවාදී හා මධ්‍යස්ථ සියලු රටවල කම්කරුවන් එකමුතුවීමේ අවශ්‍යතාවය අපි පෙන්වා දෙන්නෙමු. සෑම රටක ම සොල්දාදුවන්ගේ හා කම්කරුවන්ගේ ද, සටන් පෙරමුනේ ප්‍රතිවිරුද්ධ පාර්ශවයන්ගේ සොල්දාදුවන් අතර ද සහෝදරත්වය සඳහා අපි කැඳවුම් කරන්නෙමු. අපි යුද්ධයට එරෙහිව තරුනයන් ද, කාන්තාවන් ද එක්රැස් කරන්නෙමු. කම්හල්, යන්ත්‍රාගාර, ගම්බද, හමුදා බැරැක්ක, යුද පෙරමුනේ හා නාවික සේනාංක තුල විප්ලවය සූදානම් කිරීම සඳහා අපි වෙහෙස නොබලා, එක දිගට, නොනවත්වා වැඩ කරන්නෙමු. [64]

## ට්‍රොට්ස්කිට ඉතිහාසයේ හිමි තැන

90. යුද්ධයේ ආරම්භය වෙන කවරදාකටත් වඩා ට්‍රොට්ස්කිගේ ජීවිතය අනතුරේ හෙලීය. පලමු ලෝක සංග්‍රාමයේ විප්ලවකාරී ප්‍රතිවිපාක පිලිබඳ නවමු මතකය අධිරාජ්‍යවාදී බලවතුන් තුල මෙන්ම සෝවියට් නිලධරය තුල ද රැඳී තිබුනි. ඔහු ජීවත්වන තාක් කල් ට්‍රොට්ස්කි පිටුවහලේ විප්ලවකාරී ආන්ඩුවෙහි නායකයා ලෙස ඉතිරිව සිටියි. යුද්ධයේ උද්ගමනය, ට්‍රොට්ස්කි බලයේ පිහිටුවිය හැකි විප්ලවකාරී ව්‍යාපාරයක් නිර්මානය කරනු ඇතැයි ස්ටැලින් බියපත් වීම නොසිදුවිය හැක්කක් ද? රුසියානු විප්ලවයේ නායකත්වය අතුගා දැමීම අවසන් කර, හතරවන ජාත්‍යන්තරයේ වර්ධනය අවහිර කොට, ස්ටැලින්වාදී ඒජන්තයන්, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුලට රිංගා ගත්හ. ඔවුන්ගේ මූලික අරමුන වූයේ ලියෝන් ට්‍රොට්ස්කි මරා දැමීමයි.

ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල ජීපීයූ ව වෙනුවෙන් වැඩකල අය අතර ට්‍රොට්ස්කිගේ පුත් ලියොන් සෙඩොව්ගේ ලේකම් මාර්ක් ස්බොරොව්ස්කි, ජේම්ස් කැනන්ගේ ලේකම් සිල්විියා කැලන්, 1937 න් පසුව ට්‍රොට්ස්කිගේ ලේකම් හා ආරක්ෂකයා ද, අනාගත එස්ඩබ්ලිව්පී නායක ජොසෆ් හැන්සන් ද විය. එටිනි යනුවෙන් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල හඳුන්වන ලද ස්බොරොව්ස්කි, 1937 ජූලි මාසයේ ජීපීයූ වෙන් පලාගිය, තමන් ට්‍රොට්ස්කිවාදියෙකු ලෙස හඳුන්වා ගත්, ට්‍රොට්ස්කිගේ ලේකම් වරයෙකු වූ අර්වින් වුල්ෆ් ද, 1937 සැප්තැම්බරයේ දී ඉග්නාස් රීස් ද, 1938 පෙබරවාරියේ දී ට්‍රොට්ස්කිගේ පුත් ලියෝන් සෙඩොව් ද, 1938 ජූලියේ දී හතරවන ජාත්‍යන්තරය පිහිටුවීමට දෙමසකට පෙර එහි ලේකම් වූ රුඩෝල්ෆ් ක්ලෙමන්ට්ගේ ද ඝාතනයන් සූදානම් කිරීමේ දී ජීපීයූවට සහාය විය. 1940 මැයි 24 වන දින ට්‍රොට්ස්කිගේ ආරක්ෂකයා ලෙස කටයුතු කල රොබර්ට් ෂෙල්ඩන් හාට් නම් ජීපීයූ ඒජන්තයාගේ උදව් ඇතිව ඔහුගේ ජීවිතය නැති කිරීමට දැරූ එක් උත්සාහයකින් ට්‍රොට්ස්කිගේ දිවි බේරුනි. 1940 අගොස්තු 20 වන දින මෙක්සිකෝවේ කොයෝආකාන්හි පිහිටි ට්‍රොට්ස්කිගේ නිවසේ දී රේමන් මර්කේඩර් නම් ජීපීයූ ඒජන්තයා විසින් ට්‍රොට්ස්කිට පහරදුන් අතර පසු දින ඔහු මිය ගියේය.

91. ට්‍රොට්ස්කි ඝාතනය ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයට එල්ල වූ මාරක පහරක් විය. ට්‍රොට්ස්කි ඔක්තෝබර් විප්ලවයේ සම නායකයා පමනක් නොව ස්ටැලින්වාදයේ නිර්දය විරුද්ධවාදියෙකු ද, හතරවන ජාත්‍යන්තරයේ මූලාරම්භකයා ද විය. 19 වන සියවසේ අවසන් දශකයේ හා 20 වන සියවසේ මුල් දශකයන් හි පැන නැගි කම්කරුවන්ගේ විප්ලවවාදී මහජන ව්‍යාපාරය පුබුදුවාලූ, සම්භාව්‍ය මාක්ස්වාදයේ අවසාන හා ශ්‍රේෂ්ඨතම දේශපාලනික, බුද්ධිමය, සංස්කෘතික හා සදාචාරාත්මක සම්ප්‍රදායේ නියෝජිතයා වූයේ ඔහුය. විප්ලවවාදී න්‍යාය පිලිබඳ සංකල්පය දර්ශනවාදය ලෙස, ද්‍රව්‍යවාදය තුල මුල් බස්සවමින් ද, වෛෂයික යථාර්තය සංවේදනය කිරීම කරා ද ඉන් පිටතට ද යොමු කරමින් හා කම්කරු පන්තිය අධ්‍යාපන ගත කිරීම හා බලමුලු ගැන්වීම කරා ගෙන ගිය අතර ධනවාදයට එරෙහි විප්ලවවාදී අරගලය සමඟ එය මූලෝපායිකව පිහිටුවීම ට්‍රොට්ස්කි මූර්තිමත් කලේය. නව විප්ලවවාදී අවධිය විසින් ඇනවූ ඓතිහාසික කාර්යයන්හි පූර්න ලෙස නිමග්න වෙමින් පුද්ගල නිදහසේ ධජය යටතේ සිය දේශපාලන වගකීම් පැහැර හැරීමට උත්සාහ කල අය ට්‍රොට්ස්කි නිරීක්ෂනය කලේ පිලිකුලෙනි. "අපගතයන්ට හිස් අවකාශයක් තුල සිය පුද්ගලිකත්වය සොයා යාමට ඉඩ හරිමු." ඔහු පැවසීය. කම්කරු පන්තිය ලැබූ පරාජයන් ගෙන් ප්‍රකාශ වන්නේ මාක්ස්වාදයේ ම "අසාර්ථකත්වය" යයි කියා සිටි අයට ද ඔහු දශමයක හෝ ඉඩක් නොදුන්නේය. එවන් තර්කයන් පදනම්ව ඇත්තේ න්‍යායික අභිනිවේශයක් මත නොව දේශපාලන දිරිසුන්කම මත බව ට්‍රොට්ස්කි සැලකිල්ලට ගත්තේය. "මාක්ස්වාදයේ අර්බුදය" පිලිබඳව මහ හඬින් බෙරිහන් දෙන අය හරියට ම, දේශපාලන ප්‍රතිගාමිත්වයේ රැල්ලට සිය බුද්ධිමය යටත්වීම ප්‍රදර්ශනය කරති. ඔවුන් සිය පුද්ගලික බිගුලුකම "නොවැදගත් හා සර්වලෝක විවේචනයේ භාෂාවකට" පරිවර්තනය කරන බව ට්‍රොට්ස්කි පෙන්වා දුන්නේය. කෙසේවුව ද, මාක්ස්වාදයේ නොගිනිය හැකි තරම්

වාම විවේචකයන්ට, දිරිසුන් පල්ලම් බැසීම හැරෙන්නට කම්කරු පන්තිය වෙත පිලිගැන්විය හැකි අන් විකල්පයක් ඇත්තේ නැත. ට්‍රොට්ස්කි නිරීක්ෂනය කල පරිදි මාක්ස්වාදයේ සතුරන් "ප්‍රතිගාමිත්වය හමුවේ තෙමේ ම නිරායුධ වෙමින් ද, විද්‍යාත්මක සමාජ චින්තනය බැහැර කරමින් ද, ද්‍රව්‍යමය පමනක් නොව සදාචාරාත්මක තත්වයන් ද බිල්ලට දෙමින් අනාගතයේ විප්ලවවාදී ප්‍රහාරයේ මොනම උරුමයක් හෝ අහිමිකර ගනිති." [65]

## එක්සත් ජනපදය යුධාවතීර්න වෙයි

92. යුද්ධයේ ආරම්භයෙහි පටන් ම එක්සත් ජනපදය දේශපාලනිකව ද, ආර්ථික මෙන්ම මිලිටරිමය වශයෙන් ද ගෝලීය අර්බුදය සමඟ ගැඹුරින්ම පැටලී සිටියේය. බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල් මුහුනපා සිටි මංමුලා සහගත තත්වය ගසාකමින් රූස්වෙල්ට් පරිපාලනය, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් දේශපාලන හා මූල්‍ය වාසි ඩැහැ ගත්තේය. කෙසේවුව ද දිගු කාලයේ දී, යුරෝපයේ ජර්මානු ආධිපත්‍යයත් ආසියාවේ හා පැසිෆික් ප්‍රදේශවල ජපන් ආධිපත්‍යයත් එක්සත් ජනපදයට දරාගත නොහැකිවිය. දෙවනුව කී කාරනයේ දී, 20 වන සියවස මුල ෆිලිපීනයේ දී ලැබූ ලේ වැකි ජයග්‍රහනයේ පටන් පැසිෆික් ප්‍රදේශ ඇමරිකානු ජලාශයක් ලෙසත්, බොක්සර් කැරැල්ල මැඩලූ තැන් සිට චීනය එක්සත් ජනපද වැයික්කියක් ලෙසත් ඔවුහු සැලකූහ. 1941 දෙසැම්බර් 7 වන දින පර්ල් වරායට ජපානය එල්ල කල ප්‍රහාරය මඟින්, වසර කිහිපයකට පෙර ඔහු පිහිට පැතූ "ඉරනමේ අසපුව" වැඩ සටහන සාක්ෂාත් කර ගැනීමට රූස්වෙල්ට්ට අවස්ථාව සැලසීය. ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් සිය ආක්‍රමනය යුක්ති යුක්ත කිරීම සඳහා උපයෝගී කර ගත් ප්‍රජාතන්ත්‍රවාදී වෙස් පෑම, මේ කාලය පුරාම මිලියන ගනනක් අප්‍රිකානු - ඇමරිකානුවන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අහිමි කිරීම මඟින් ද, එක්සත් ජනපදයේ වාසය කල දහස් ගනනක් ජපන් ජාතිකයන් බලහත්කාරි ලෙස හමුදාවට බඳවාගැනීම ඇතුලු යුද කාලයේ ක්‍රියාත්මක කල ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර මඟින් ද නිරාවරනය විය. "ජාතික ආරක්ෂක රාජ්‍යයේ" සැකිල්ල වැඩි වශයෙන් ගොඩනඟනු ලැබුවේ යුද්ධය පැවති වකවානුව තුලය. 1941 ජූනි මාසයේ සෝවියට් සංගමයට නාසි ජර්මනිය විසින් පහරදුන් කල, ස්ටැලින්වාදී පක්ෂ එක්සත් ජනපදය තුල වැඩ වර්ජනය නොකිරීමේ පොරොන්දුවට නිර්ලජ්ජිත ලෙස සහාය දක්වමින් "ප්‍රජාතන්ත්‍රවාදී" අධිරාජ්‍යවාදී බලවතුන්ගේ උද්යෝගීමත් මුක්කු කරුවන් බවට පත්විය.

93. ට්‍රොට්ස්කි ඝාතනයෙන් පසු කාලයේ දී සමාජවාදී කම්කරු පක්ෂය, නිර්ධන පන්ති ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනය ආරක්ෂා කල අතර රූස්වෙල්ට් පරිපාලනයේ අධිරාජ්‍යවාදී යුද අරමුනු වෙනුවෙන් කම්කරු පන්තියේ ස්වාධීනත්වය යටපත් කිරීමට විරුද්ධ වූහ. මේ හේතුව මත, යුද කාලයේ එක්සත් ජනපදය තුල සිරගත කරනු ලැබූ නායකයන් සහිත කම්කරු ව්‍යාපාරයේ එකම ප්‍රවනතාවය එස්ඩබ්ලිව්පී ය වූ අතර, පසුව ව්‍යවස්ථා විරෝධී යයි නම් කරනු ලැබූ, 1940 ස්මිත් පනත යටතේ චෝදනා ලැබූ ප්‍රථමයන් වූයේ ද ඔවුන්ය. 1941 දී එස්ඩබ්ලිව්පී නායකයන් හා සාමාජිකයන් 18 දෙනෙකුට විරුද්ධව, ගොතන ලද කැරලි ගැසීමේ චෝදනා එල්ල කරන ලදී. යුද කාලයේ ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ ඇති කර ගෙන තිබූ සන්ධානයට හා ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය කෙරෙහි පෑ නිර්දය විරුද්ධත්වයට අනුකූලව යමින් කොමියුනිස්ට් පක්ෂය නඩුවට සහාය දැක්වූහ. යුද්ධයෙන් පසුව ස්මිත් පනත යටතේ කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන්ට චෝදනා එල්ල වූ කල එස්ඩබ්ලිව්පී ය, ධනේශ්වර රාජ්‍යයෙන් ස්ටැලින්වාදීන්ට එල්ල වූ ප්‍රහාරයන්ගෙන් ඔවුන් ආරක්ෂා කිරීමේ මූලධර්මාත්මක ආස්ථානයක් ගත්තේය.

94. දෙවන ලෝක යුද්ධයේ බිහිසුනු ප්‍රතිවිපාකයන් පෙන්නුම් කලේ කම්කරු පන්තියට ලක්ෂම්බර්ග් කල අනතුරු ඇඟවීමේ නිවැරදි තාවයයි. ඇය කියා තිබුනේ කම්කරු පන්තිය ඉදිරියේ ඇත්තේ විකල්පයන් දෙකක් පමනක්, එනම් සමාජවාදය හෝ ම්ලේච්ඡත්වය, බවයි. යුද්ධයේ කාල පරිච්ඡේදය තුල සිදුකල අපරාධ සමස්ත පරම්පරාවක් ඉදරියේ ම ධනවාදයේ සැබෑ මුහුනුවර හෙලිදරව් කරනු ලැබුනි. නාසි ජන සංහාරයේ දී මිලියන හයක යුදෙව්වන් ද රෝමා නම් සෝවියට් යුද සිරකරුවන් මිලියන පහක් ද පෝලන්ත වැසියන් හා ෆැසිස්ට් තන්ත්‍රය විසින් ඉලක්ක කල අනෙකුත් අය ද ඝාතනය කරන ලදී. සිරකරුවන් ඔවුන්ගේ මරනය කරා ප්‍රවාහනය කල දුම්රිය මාර්ගවලට බෝම්බ දැමීම ප්‍රතික්ෂෙප කල එක්සත් ජනපද ආන්ඩුව, ජන සංහාරයේ නාසි ක්‍රියාමාර්ගය නොතකා හැරීම මඟින් ප්‍රදර්ශනය කලේ, ජපානයේ සිවිල් නගර දෙකකට පරමානු බෝම්බ දෙකක් හෙලමින් ප්‍රදර්ශනය කල ම්ලේච්ඡත්වය පිලිබඳ තමන්ගේ ම ශක්‍යතාවයයි. එමඟින් ඝාතනය කෙරුනු ජන සංඛ්‍යාව දෙලක්ෂය හා තුන් ලක්ෂ පනස් දහසක් අතර වෙයි. මෙම අපරාධයේ මූලික අරමුන වූයේ ජන සංහාරක නවීන ඇමරිකානු අවිවල විනාශකාරී ශක්‍යතාවය ලෝකය, විශේෂයෙන්ම සෝවියට් සංගමය, හමුවේ ප්‍රදර්ශනය කිරීමයි. සය වසරක ගැටුමෙන් සමස්තයක් ලෙස මිලියන සීයකගේ ජීවිත වනසා දැමුනි. සමාජවාදී විප්ලවය අසාර්ථක වීමත් කම්කරු පන්ති නායකත්වයේ ද්‍රෝහිත්වයත් හේතු කොට ගෙන කම්කරුවන්ට ගෙවීමට සිදුවූ කර්කෂ මිල යුද්ධයයි. පසුව පශ්චාත් යුද කාලීන උත්පාතය ගොඩනඟනු ලැබුනේ මිනී කඳු මතයි.

**මතු සම්බන්ධයි**

## සටහන්

[47] සකප පිහිටුවන ලද්දේ 1938 ජනවාරියේ දී ය. ඒ කැනන් එක්සත් ජනපදය තුල ට්‍රොට්ස්කිවාදය සඳහා අරගලයට මූලිකත්වය ගෙන දශකයකට ආසන්න කාලයකට පසුව ය. මෙම 10 වසරක කාලය තුල දී ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීහු කම්කරු පන්තියේ අරගල තුල සැලකිය යුතු මැදිහත්වීමක් තහවුරු කර ගත්හ. 1934 දී මිනියපොලිස් මහා වර්ජනය තුල ඔවුන්ගේ නායකත්වය ජාතික හා ලෝක පරිමාන අවධානයක් දිනා ගත්තේ ය.

[48] *In Defense of Marxism,* මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා (ලංඩන් නිව් පාර්ක්, 1971 ) 15 පිට

[49] එම,

[50] එම, 236 පි.

[51] මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා, කම්කරු මාවත ප්‍රකාශන, 13-15 පිටු.

[52] එම 84-85 පිටු

[53] එම, 3 පිටුව.

[54] *The Struggle for a Proletarin prty,* කම්කරුවන්ගේ පක්ෂයක් සඳහා අරගලය (නිව් යෝර්ක් පාත්ෆයින්ඩර් ප්‍රෙස්, 1977) පි. 6.

[55] එම, 10-11 පිටු.

[56] *In Defense of Marxism,* මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා (ලන්ඩන්ඃ නිව් පාර්ක්, 1971) පි. 206.

[57] *Writings of Leon Trotsky 1938-39,* 1939-40 ට්‍රොට්ස්කිගේ ලියවිලි, ( නිව් යෝර්ක් පාත් ෆයින්ඩර් 2001) 99 පිටුව.

[58] එම 233 පිටුව.

[59] එම 227 පිටුව.

[60] එම.

[61] එම 229 පිටුව.

[62] එම 231 පිටුව.

[63] එම 239-40 පිටු.

[64] එම 265.

[65] *Writings of Leon Trotsky 1938-39,* 1938-39, ලියෝන් ට්‍රොට්ස්කිගේ ලියවිලි, (2002, නිව් යොර්ක් පාත් ෆයින්ඩර්) - 238-39 පිටු.

© www.wsws.org